# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය , බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1007 / | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 14/06/2024<br>පැය 1600 |

## මාධ්‍ය නිවේදනය

### දෙහිඕවිට සුසිලෝදය විහාරස්ථානය මඟින් සංවිධානය ලබන මිහිඳු මහා පෙරහර වීථි සංචාරය - රථවාහන ගමනාගමනය සීමා කිරීම සම්බන්ධව.

දෙහිඕවිට පොලිස් වසමේ දෙහිඕවිට සුසිලෝදය විහාරස්ථානය මඟින් වාර්ෂිකව පවත්වනු ලබන මිහිඳු පෙරහර 2024.06.15 වන දින රාත්‍රී 08.00 සිට මධ්‍යම රාත්‍රී 12.00 දක්වා කාලය තුල වීථි සංචාරය කිරීමට නියමිතව ඇත.

පෙරහර දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ආරම්භ කර කෑගල්ල අවිස්සාවේල්ල මාර්ගයේ අවිස්සාවේල්ල දෙසට ගමන් කර දෙහිඕවිට බෞද්ධ කනිෂ්ඨ විද්‍යාලය අසලින් පැරණි දුම්රියපල මාර්ගයේ ගමන් කර විහාරස්ථානයට පැමිණීමට නියමිතය.

පෙරහර ගමන් ගන්නා කාලය තුල ඉහත ප්‍රධාන මාර්ගයේ රථ වාහන ගමනාගමනයට බාධා පැමිණිය හැකි බැවින් පහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

**විකල්ප මාර්ග**

- කෑගල්ල දෙස සිට අවිස්සාවේල්ල දෙසට ගමන් ගන්නා රථ වාහන සඳහා අටළුගම, දෙබෑගම හන්දියෙන් දකුණට ඇති කඹුරාපොල මාර්ගයේ ගමන් කර ඉහළ තල්දූව මඤ්ඤොක්කා ගහයට හන්දියෙන් අවිස්සාවේල්ල ප්‍රධාන මාර්ගයට ගමන් කල හැක.

- අවිස්සාවේල්ල දෙස සිට කෑගල්ල දෙසට ගමන් ගන්නා රථ වාහන තල්දූව හන්දියෙන් වමට ඇති ගුරුගල්ල මාර්ගයේ ගමන් කර දකුණට ඇති නාපාවල, දයිගල, කුරුපැත්ත මාර්ගයේ ගමන් කර මාගම්මන හන්දියෙන් කෑගල්ල ප්‍රධාන මාර්ගයට ගමන් කල හැක.

- කෑගල්ල දෙස සිට අවිස්සාවේල්ල දෙසට ගමන් ගන්නා බර වාහන රුවන්වැල්ල නගරයේ ඔරලෝසු කණුව අසලින් දකුණට ඇති නිට්ටඹුව මාර්ගයේ ගමන් කර ගෝනගල්දෙනිය හරහා තල්දූව නිට්ටඹුව මාර්ගයට ගමන් කල හැක.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.